මධ්‍යම පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුව : චක්‍රලේඛ අංක:01/2002

මගේ අංකය: සීපීසී/එස්එස්/1/සීඅයිආර් – x
සමාජසේවා හා පුනරුත්ථාපන කටයුතු දෙපාර්තමේන්තුව,
35/ඒ, බෝධියංගන මාවත,
මහනුවර.
2002 මාර්තු මස 13 වැනි දින.

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

අඩු ආදායම්ලාභීන් සඳහා ඇස්කණ්ණාඩි ලබාදීම

මෙම දෙපාර්තමේන්තුව මගින් දෙයාකාරයකින් අඩු ආදායම්ලාභීන් සඳහා ඇස්කණ්ණාඩි ලබාදීමට කටයුතු කරනු ලැබේ. එනම්:-

1. කේවල.
2. පොදු.

* කේවල ක්‍රමය මගින් තනි පුද්ගලයින් සඳහා ඇස්කණ්ණාඩි ලබාදෙනු ලැබේ. එහිදී පහත සඳහන් පියවරයන් අනුගමනය කළයුතු වේ.

  * වෛද්‍යවරයෙකු වෙත යොමු වී වෛද්‍ය වාර්තා ලබාගත් පුද්ගලයෙකු පළාත් සමාජසේවා නිලධාරී වෙත සිය අවශ්‍යතාවය ඉදිරිපත් කළවිට ඒ පිළිබඳ පරීක්ෂා කර බලා එම නිලධාරියාගේ නිර්දේශ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම. එම නිර්දේශ සමඟ එකඟ වන්නේ නම් ප්‍රාදේශීය ලේකම් විසින් සිය නිර්දේශද සහිතව අඹලවූවත් පිළිබඳ වාර්තා ව හා වෛද්‍ය වාර්තාවේ මුල්පිටපත සමාජසේවා පළාත් අධ්‍යක්ෂ වෙත යොමු කිරීම.

  * සති තුනක් (3) ඇතුළත ඇස්කණ්ණාඩිය සකස් කර දෙනු ලබන අතර, අවම වශයෙන් සති දෙකක් ඇතුළත අදාළ පුද්ගලයා වෙත ඇස්කණ්ණාඩිය සමාජසේවා නිලධාරී විසින් භාරදී, ඒ බැව් වාර්තා කළයුතුය.

* පොදු ක්‍රමය මගින් මහජන සංවිධාන/කණ්ඩායම් මගින් කරන ඉල්ලීම් අනුව ගම් මට්ටමේදී සායන පවත්වා ඇස්කණ්ණාඩි ලබාදීම සිදු වේ. මෙවැනි සායනයක් පැවැත්වීම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළයුතු වේ.

  1. එම ප්‍රදේශය තුළ පසුගිය ආසන්න වසර තුනක් තුළ එවැනි සායන පවත්වා නොතිබීම.

  2. නිශ්චිත ග්‍රාම නිලධාරී වසම් 2 – 5 ක් ආවරණය වන පරිදි සායනය පැවැත්වීම.

  3. හැකි සෑම අවස්ථාවකදීම අක්ෂි වෛද්‍යවරයෙකු සහභාගී කරවා ගැනීම. එය අපහසු වන අවස්ථා වලදී පමණක් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන්විට සුදුසුකම්ලත් දෘෂ්ටි පරීක්ෂකයින් මගින් සායනය පැවැත්වීමට කටයුතු කරනු ඇත.

  3.1 එලෙස දෘෂ්ටි පරීක්ෂකවරුන් විසින් පවත්වනු ලබන සායන සඳහා අවුරුදු 15 ට අඩු දරුවන් සහභාගී නොකළ යුතු අතර, ඔවුන් සඳහා ඇස්කණ්ණාඩි සපයනු ලබන්නේ වෛද්‍යවරයෙකුගේ වාර්තාවන් මතම පමණි.

3.2 පාසැල් දරුවන් සඳහා ඇස්කණ්ණාඩි ලබාදීම අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන බැවින්, ඒ සඳහා ඔවුන් යොමු කිරීම වඩාත් සුදුසුයි.

4. සායනය පැවැත්වෙන දිනයේදී අදාළ ග්‍රාම නිලධාරී වසම් වල ග්‍රාම නිලධාරීන්ද පළාත් සමාජසේවා නිලධාරීද සහභාගී විය යුතු අතර, ඇමුණුම් 1 හි සඳහන් පරිදි නාම ලේඛණ පිටපත් දෙකක් සහිතව පිළියෙල කර නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළයුතු වේ. අවු:15 - 70 දක්වා සහ අවු:70ට ඉහළ අය සඳහාද වෙනම ලේඛණ වශයෙන් ලේඛණයක් තිබිය යුතුය.

5. සායනය සඳහා සහභාගී කරවා ගත යුත්තේ අඩු ආදායම්ලාභීන් පමණකි. ඒ බවට ග්‍රාම නිලධාරී සහතික විය යුතු වේ.

6. ඇස්කණ්ණාඩි සපයන්නන් පිළිබඳව ඉහත නාම ලේඛණයේ පිටපතක් ග්‍රාම නිලධාරී වෙතද තබා ගැනීම සුදුසු වන්නේ නැවත ඉල්ලීම් කරන අවස්ථාවේදී මීට පෙර ලබාගෙන තිබේදැයි පරීක්ෂා කිරීමට එමගින් පහසු වන බැවිනි.

7. එක් දින සායනයකට සහභාගී කරවිය හැකි උපරිම සංඛ්‍යාව 150කි. දෘෂ්ඨි පරීක්ෂකවරුන් දෙදෙනෙකු සේවයේ යොදන්නේ නම් පමණක් 300 දෙනෙකු යොමු කළ හැකිය.

8. සායන පවත්වා උපරිම වශයෙන් මාස 2ක් ඇතුළත ඇස්කණ්ණාඩි බෙදාදීම කළයුතු වේ.

(ජේ.සී.රණේපුර).
පළාත් අධ්‍යක්ෂ - සමාජසේවා,
සමාජසේවා හා පුනරුත්ථාපන කටයුතු දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත් සභාව.

එන්/-